## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 දෙසැම්බර් 11 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ගිණුම් වලින් අත්හැරීම්**

i) ඉකුත් වර්ෂයේදී බේරුම්කරණ නඩුවක දී තිබූ තීන්දුවකට අනුව මහා නගර සභාවට රු. 13,313,438 ක් පෞද්ගලික ආයතනයකට ගෙවන ලෙස නියම කර තිබුණ ද ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

ii) බැංකු ජංගම ගිණුම් 05 කට අයකර තිබූ බැංකු ගාස්තු හා සෘජු හර කිරීම් එකතුව රු. 2,964,013 ක් හා බැර කිරීම් රු. 141,560 ක් ගිණුම්ගත කර නොතිබුණි.

iii) නෙදර්ලන්ත ආධාර ක්‍රමය යටතේ 2007 නොවැම්බර් සිට 2008 මාර්තු දක්වා ලැබී තිබුණු වාහන 06 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**(ආ) ගිණුම් වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්**

i) සමාලෝචිත වර්ෂයේ දේපළ ණය පොළී සඳහා රු. 832,811 ක් ගිණුම්ගත කර තිබුණ ද ගිණුම්ගත කළ යුතු පොලිය රු. 758,854 ක් විය.

ii) සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබූ කර්මාන්ත ආධාර රු. 77,010 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

iii) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන ගබඩාවට ලැබී තිබූ භාණ්ඩ වල වටිනාකම රු. 1,604,518 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා ණය හිමි හා තොග ශේෂ අඩුවෙන් දැක්විණි.

iv) ආරම්භ නොකරන ලද කර්මාන්ත 06 ක් සඳහා රු.9,099,476 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි.

v) ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.32,377,811 ක් වූ අතර, උපයෝගි ලේඛණ/වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.22,184,675 ක් විය.

vi) 2006 සිට 2008 වර්ෂය දක්වා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල වූ රු. 4,051,330 ක් ගෙවිය යුතු ගිණුම් වල ඇතුලත් වී තිබුණි.

## 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2012 ජනවාරි 23 දින වන විට විගණන විමසුම් 03කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.5,668,538 ක් විය.

### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

(i) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 71,261,149 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ ණයහිමි කපා හැරීම් රු. 30,723,861 ක් සඳහා මහා සභා අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(iii) 2011 දෙසැම්බරේ 31 දිනට ලැබිය යුතු ශේෂ වල එකතුව රු.206,387,906 ක් වූ අතර ගෙවිය යුතු ශේෂ වල එකතුව රු. 184,395,079 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මා වූ ආදායම රු. 57,733,176 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මා වූ ආදායම රු. 50,657,244 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | වියදම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 146,612 | 160,750 | 105,466 |
| (ii) | බදු කුලී | 24,872 | 21,152 | 16,219 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,301 | 3,139 | 6,637 |
| (iv) | වෙනත් ආදායම් | 134,310 | 75,025 | - |

### **2.2.2 වෙනත් ආදායම**

මහා නගර සභා ආඥා පනතේ 247 (අ) පරිදි නගර සභා බල ප්‍රදේශය තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයෙ ලියාපදිංචි කර ඇති හෝටල්, ආපනශාලා/ නවාතැන් පොළවල් වල වාර්ෂික ආදායමින් 1% ක ගාස්තුවක් අය කළ යුතු වුවද සභාව විසින් එම ආදායම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ආර්ථික නොවූ ගනුදෙනු

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ඔවුන්ගේ උපදෙස් නොසලකා රු. 6,129,229 ක් වැය කර ඉදි කර තිබූ ගොඩනැගිල්ල 2012 ජුනි මාසයේදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් කඩා ඉවත් කර තිබුණි.

(ආ) 2012 මැයි 29 දින කල් පිරීමට නියමිතව තිබූ රු. 5,000,000 ක ස්ථාවර තැන්පතුවක් 2011 ඔක්තෝම්බර් 25 දින නිදහස් කර ගෙන අදාළ කටයුත්තට නොයොදවා 2012 මැයි 17 දින දක්වා ගෙවීම් අණකරයක් ලෙස අත රඳවා ගෙන තිබුණි. එකී මුදල සත්දින තැන්පතුවක හෝ ආයෝජනය කළේ නම් රු. 173,727 ක පමණ පොලී ආදායමක් උපයා ගැනීමට හැකියාවක් තිබූ බව නිරීක්ෂණය විය .

(ඇ) සභාවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍ර ගොඩනැගිල්ල සඳහා ට්‍රාන්ස්පෝමරය මගින් සපයන ලද විදුලි සේවාවන් වෙනුවෙන් 2011 ජනවාරි සට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විදුලි බිල්පත් මත රු. 20,709 ක ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුව තිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් මාසයේදී මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් පෙර මිශ්‍රණ කියුබ් 48.32 ක්, තාර බැරල් 23 ක්, භූමිතෙල් ලීටර් 32ක්, ABC කියුබ් 28.52 ක් හා $^1/_2$ චිප්ස් ගල් කියුබ් 3.52 ක් යොදාගෙන තිබුණද කර්මාන්ත සඳහා අවශ්‍යතාවය ඇස්තමේන්තු කර නොතිබුණි. අමුද්‍රව්‍ය යෙදවුම් ප්‍රමාණය පිළිබඳව හෝ අදාළ කර්මාන්තය නිම කල බවට කාර්මික නිළධාරියෙකු විසින් වාර්තා කර නොතිබුණි.

(ආ) නාවල ආදාහනාගාරයේ සේවා සහ නඩත්තු කිරීමේ කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2009 දෙසැම්බර් 01 දින ගිවිසුමකට එළඹ ඒ වෙනුවෙන් වාර්ෂික සේවා ගාස්තුව වු රු. 186,984 ක මුදල එකවර ගෙවා තිබුණි.අදාල සමාගම සේවා සැපයීම පිළිබඳව වු ගිවිසුම කඩ කර තිබූ අතර, එම සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනිමට කටයුතු කර නොතිබුණි. ගිවිසුම කඩකිරීමේදී ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳව වගන්ති, සේවා ගිවිසුමට ඇතුලත් නොකිරීම නිසා මෙම තත්වය උද්ගත වී ඇති බව නිරික්ෂණය විය.තවද මෙම සේවා හා නඩත්තු කටයුතු සමාලෝචිත වර්ෂයේදී වෙනත් පෞද්ගලික සමාගමකට පවරා තිබූ අතර එකී සමාගම සමග සභාව විසින් සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) චන්ද්‍රා ද සිල්වා ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් සභාවට එරෙහිව පවරා තිබූ බේරුම්කරණ නඩුවේ දී 2010 නොවැම්බර් 25 දින ලද තීරණය පරිදි සභාව විසින් කොන්ත්‍රාත්කරුට රු. 13,838,439 ක් ගෙවිය යුතුව තිබුණි. සභාව එම තීරණයට අනුව කටයුතු නොකිරීම මත කොළඹ වාණිජ මහාධිකරණයද 2012 මාර්තු 08 දින ඉහත බේරුම්කරණ නඩුවේ තීන්දුව බලාත්මක වන අයුරින නැවත තීන්දුවක් ලබා දී තිබූ අතර බේරුම්කරණ නඩුවේ තීන්දුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ගෙවීමට නියමවූ ප්‍රමාද ගාස්තු ද සමඟ සභාව විසින් 2012 ඔක්තෝබර් 23 දින රු. 14,402,259 ක් අදාල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දින හා අංක PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී පොත් මිලදී ගැනීම සඳහා රු. 6,795,611 ක් වැය කර තිබූ අතර පාසැල්

පංති පොත් ලැයිස්තුවලට අනුකූල නොවන ලෙසන් පොත් පාර්සල් කර තිබීම නිසා රු. 689,387 ක් පමණ වටිනා පොත් නොබෙදා ඉතිරිව තිබුණි.

(ඈ) මහා නගර සභා ආඥා පනතේ 40 වන වගන්තියේ (1) (ඌ) උප වගන්තියයේ විධි විධාන වරදවා දක්වමින් 2000 මැයි 05 දින රාජගිරිය 4 වන පටුමගෙහි පර්චස 5.30 බැගින් වූ ඉඩම් කොටස් 05 ක් එක් කොටසක් රු. 550 බැගින් ගැනුම්කරුවන් 05 දෙනෙකුට විකුණා තිබූ අතර ඔවුන් විසින් 2005 නොවැම්බර් 29 දන ඉහත කී බිම් කැබලි ඒකාබද්ධ කර රු. 5,300,000 කට නැවත විකුණා තිබුණි. පර්චස් 4.70 ක වූ ඉඩමේ ප්‍රවේශ මාර්ගය රු. ලක්ෂ 06 කට තක්සේරු කර ඉඩමේ වර්තමාන හිමිකරුවන්ට පවරා දීමට සභාව කටයුතු කරමින් තිබුණි.

(ඇ) මාළිගාව පාර අංක 45/10 වත්තෙ නිවාස 08 ක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත 2011 වර්ෂයේදී රු.1,109,709 ක ගෙවා තිබුණු අතර එම නිවාස ඉදිකල ඉඩම සභාවට පවරා ගෙන නොතිබුණි.

(ඉ) මිල කැඳවීම්,තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා මුදල් කමිටු අනුමැතිය නොමැතිව පාවිච්චි කරන ලද පරිගණක උපාංග (මොනිටර් 11 ක් )සමාලෝචිත වර්ෂයේ රු. 41,500 ක මුදලකට මිලදීගෙන තිබුණි.

(ඊ) මහා නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස් 2007 අගෝස්තු මස සිට වර්ෂ 05 ක් පුරා නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමේ කටයුතු සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 13 (3) වගන්තියේ විධිවිධාන අනුව අදාළ තනතුරට ස්ථිර පත්කිරීමක් සිදු කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(උ) අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඌ) ජංගම ගිණුම් 02 කට අදාළව නිකුත් කල එහෙත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ රු. 1,063,034 ක් වූ චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 නියමය යටතේ කටයුතු කර නොතිබුණි.

(එ) ගිණුම් විෂයයන් 05කට අදාලව එකතු වටිනාකම රු. 2,136,594 ක් වූ ගිණුම් ශේෂ වර්ෂ 06කට අධික කාලයක් තුල නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබෙන අතර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.6 කාය වර්ධන මධ්‍යස්ථාන

2012 මාර්තු මාසයෙහි කරන ලද නියැදි පරීක්ෂණයකදි , නිරීක්ෂනය වු කරුණු පහත පරිදි වේ.

(i) සභාවට අයත් කාය වර්ධන මධ්‍යස්ථාන 12න් මධ්‍යස්ථාන 05ක් ක්‍රියාකාර තත්ත්වයේ නොපැවතුණි.

(ii) සපුමල් පෙදෙස කාය වර්ධන මධ්‍යස්ථානයට 2010 මාර්තු 09 දින භාර දෙන ලද රු. 375,000 ක් වටිනා Trade mill යන්ත්‍රය ක්‍රියා විරහිත ව පැවතුනි.

(iii) වැලිකඩ ප්ලාසා ගොඩනැගිල්ලේ පලවන මහලේ අංක 18 ස්ථානයේ කායවර්ධන මධ්‍යස්ථානයේ රු. 2,539,989 ක් වැය කර වැඩි දියුණ කල කාය වර්ධන මධ්‍යස්ථානය වර්ෂයකට අධික කාලයක් ගත වුව ද අදාළ කාර්ය සඳහා යොදවා ගෙන නොතිබුණි.

## 2.7 අධිභාර

මහා නගර සභා ආඥා පනතේ 252 වන අධිකාරය 261(1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2011 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු. 25,550,166 ක් විය.

## 2.8 වත්කම් කළමනාකරණය

### (අ) අය විමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ සේවක ණය, සේවක අත්තිකාරම් ශෙෂ වල එකතුව රු. 87,214,721 ක් වූ අතර මාරු වී ගිය හා සේවය හැරගිය අයගේ හිඟ ණය ශේෂ රු. 3,335,741 ක් පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි

### (ආ) අචල ජංගම වත්කම්

2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 03 ක කාලයක් ඉක්මවා අචලව පවතින අක්‍රීය මුදල් ශේෂ වල අගය රු. 183,598 ක් විය.

## 2.9 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු සංචිත වාහන, නිලධාරීන්ගේ නිවෙස්වල සති අන්ත හා නිවාඩු දිනයන්හි දින ගණන් ගාල් කර තිබූ අවස්ථා හා එම දිනයන්හි අනුයුක්ත රියදුරන්ට අතිකාල ගෙවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) සති අන්ත හා නිවාඩු දිනයන්හි නිලධාරීන් ප්‍රවාහනය කරන වාහන කාර්යාල භූමියට නිලධාරියාද සමඟ පැමිණ කෙටි වේලාවකින් නිලධාරියාද සමඟම නැවත පිට වී ඇති අවස්ථා නිරීක්ෂණ වූ අතර එම දිනයන්ට අදාලව නිලධාරීන් විසින් 1/20 දීමනාව ලබා ගෙන තිබුණි.

(ඇ) සති අන්ත හා නිවාඩු දිනයන්හි නිලධාරීන් විසින් සභාව වෙත වාහන පදවන අතර අදාල රියදුරන් අතිකාල ලබා ගත් අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ඇ) අංක RS - 1248 දරණ ලෝඩරය වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයකින් තොරව සතියේ දිනවල හා සති අන්තයේ සේවයේ යොදවා තිබූ අතර සති අන්ත රාජකාර් සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. මේ සඳහා රු. 194,901 ක් වටිනා ඩීසල් ලීටර් 2616 ක් 2011 මුල් අර්ධ වර්ෂය තුල වැය කර තිබුණි.

## 2.10 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය